# An Investigative Study of Early Buddhist and *Yōgāchāra* Viññānavādi Opinion of Rebrith

## “භවගාමීත්වය” පිළිබඳ ආදි බෞද්ධ හා යෝගාචාර විඥානවාදි මතවාදයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

Karapikkada Sobitha

ආදි බුදුසමයට අනුව ජීවිතයක ආරම්භය යනු උපතක් නොවේ. පුද්ගලයා අනාදිමත් කාලයක පටන් සසර තුළ නොයෙකුත් දුක් විදිමින් පැමිණෙන බවත්, එසේම දුක කෙළවර කරන තුරු සසර පුරාවට ගමන් කරන බවත් බෞද්ධ ඉගැන්වීමයි. මේ තුළින් පැහැදිලි වන කරුණ නම්, ආදි බුදුසමය පුද්ගල භවගාමිත්වය පිළිගන්නා බවයි. එසේ නම් මෙම භවයෙහි වූ පුද්ගලයා මතු භවය කරා ගමන් කරන්නේ කෙසේ ද, යන්න පිළිබඳ බෞද්ධ ආකල්පය විමර්ශනය කළ යුතු වේ. මේ පිළිබඳ ඍජු දේශනාවක් ආදි බුදුසමයෙහි දක්නට නොලැබෙන බැවින්, ඡායාමාත්‍ර වූ දේශනාවන් මත යම් අදහසක් ඉස්මතු කරගත යුතු වේ. බුදුසමයට අනුව පුද්ගලයාගේ මෙම භවයෙහි වූ අවසාන චිත්තය චුති චිත්තයයි. ඉන්පසු ඔහුගේ මරණය සිදුවන අතර, දී.නි. මහාසතිපට්ඨාන සූත්‍රයේ දී මරණය ලෙස දක්වන්නේ සත්වයාගේ බිඳීමත්, චුතවීමත්ය. මෙම විග්‍රහයේ එන පද විමසුම් ලෙස බැලීමේ දී, ඒ සියල්ල අවධි විභක්ත්‍යන්ත පද ලෙස දක්වා ඇති බැවින්, එහි දී සත්වයාගේ විනාශයක් අවධාරණය නොවේ. එසේම මතු භවයක් ලෙස ආදි බුදුසමයෙහි දැක්වෙන්නේ ප්‍රතිසන්ධි චිත්තයාගේ නිර්මාණයයි. එය උපත නම් වන අතර, මේ පිළිබඳ දක්වන දී.නි. මහාසතිපට්ඨාන සූත්‍රය, එය නැවත ආරම්භයක් ලෙස නොව, නැවත පහළ වීමක් ලෙස දක්වා ඇත. එසේම ප්‍රතිසන්ධි චිත්තයාගේ නිර්මාණය ද චුති චිත්තයේ නිරුද්ධ වීමත් සමඟ ඒ හා බැඳී හටගනු ලබයි. ඒ අනුව කූඩැල්ලෙකුගේ ගමන් විලාසය මෙන් චුති චිත්තය මතු භවය හා සම්බන්ධ වීමෙන් නිරුද්ධ වන බව සිතිය හැක. මෙය ආත්මවාදී දර්ශනයක් ලෙස ඇතමුන් විග්‍රහ කළ ද, මෙහි පවත්නා වූ ප්‍රතීත්‍යසමුප්පාද න්‍යායානුකූල ක්‍රියාකාරීත්වයෙහි දී එය ආත්ම වාදයෙන් බැහැර වී ඇත. මීට අමතරව පෙර භවයත් මතු භවයත් අතර අන්තරාභව අවස්ථාවක් පිළිබඳ ඇතමුන් අදහස් දක්වන නමුදු, ආදි බුදුසමය අනුව එය පිළිගත නොහැක. සූත්‍ර දේශනාවල දක්නට ඇති ඡායාමාත්‍ර වූ එවැනි දේශනා ඔවුහු වරදවා වටහාගෙන ඇති බවක් පෙනේ. ථෙරවාදි සම්ප්‍රදායේ ද ඇතැම් විවරණයන්හි අන්තරාභව අවස්ථාව පිළිගෙන ඇති බව දැකිය හැකි නමුදු, සමස්තයක් ලෙස ථෙරවාදය එම ඉගැන්වීම් බැහැර කරන්නා වූ සම්ප්‍රදායකි. මේ අනුව පුද්ගලයා විසින් සිදුකරනු ලබන පුඤ්ඤ-පාප, කුසල-අකුසල විඤ්ඤාණය පදනම්ව භවගාමීත්වය තුළ ක්‍රියාත්මක වේ. මේ පිළිබඳ යෝගාචාර විඥානවාදි ආකල්පය විමසීමේ දී, ඔවුහු දක්වන්නා වූ ආලය විඥානය සාංසාරික වූ විඥාන ධාරාවකි. එහි නැවැත්ම අර්හත්වයයි. ඒතාක් දක්වා ආලය විඥානය නොකැඩී ගමන් කරනු ලබන අතර, පුද්ගලයා විෂයෙහි වූ සියලු කර්ම වාසනා ශක්තීන් මෙහි අන්තර්ගත වේ. ඒවා ආලය විඥානයේ මූල බීජ ලෙස තැන්පත් වී සංසාරය තුළ ක්‍රියාත්මක වේ.

ප්‍රමුඛ පදඃ භවගාමීත්වය, චිත්තය, විඤ්ඤාණය, අන්තරාභවය, බීජ